## 2.00 ශාරීරික දඬුවම්

සෑම අවස්ථාවක දී ම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශාරීරික දඬුවම් දීමෙන් වැළකිය යුතු ය. විදුහල්පතිවරුන්, ගුරුවරුන් විසින් සිසුවා තුළ චර්යාමය වෙනසක් ඇති කිරීමේ චේතනාවෙන්, සද්භාවයෙන් වුව ද ශාරීරික දඬුවම් කිරීම නොකළ යුතු ය. මෙහි දී දඬුවම් දීමෙන් නොව, කරුණු අවබෝධ කරදීම, ආදර්ශය හා මනා සංවිධානය මගින් අභ්‍යන්තර වශයෙන් ස්වයං විනයක් ඇතිකර ගැනීමට පුහුණු කිරීමෙන්, කෙනෙකු සිය ජීවිතය පුරාම නිතිගරුක පුද්ගලයකු වශයෙන් ජීවත්වීමට අවශ්‍ය පුහුණුව ලබාගන්නා බව අමතක නොකළ යුතු ය.

ශ්‍රී ලංකාව විසින් ද අත්සන් කර, ස්ථිරකර ඇති (1989) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 28(2) වගන්තිය මගින් ද පාසල් විනය පරිපාලනය ළමයාගේ මානව ගරුත්වයට අනුකූල වන ආකාරයට සිදු කරන බවට වගබලා ගත යුතු බව අවධාරණය කර ඇත.

2.1 ශාරීරික දඬුවම් සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයන්ගෙන් හෙළි වී ඇත්තේ ළමුන් තුළ විනය හැඩ ගැස්වීමේ දී දෙන ලද දඬුවම්වලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබී ඇති බවත් පහත සඳහන් අහිතකර තත්වයන් මතුවීමට ඉඩකඩ ඇති බවත් ය.

- I. ශාරීරික දඬුවම් භාවිත කිරීම තුළින් හොරකම් කිරීම, පහරදීම වැනි සමාජ විරෝධී චර්යා රටා සිසුන් තුළ මතුවීම
- II. ළමා අපහරණයට ඇති අවදානම වැඩිවීම
- III. සිසුන් තුළ ආක්‍රමණශීලි චර්යා රටා ඇතිවීම
- IV. ශිෂ්‍යයා හා ගුරුවරයා/ විදුහල්පතිවරයා අතර සම්බන්ධතා ක්‍රමයෙන් විනාශ වී යාම
- V. නිශේධාත්මක සමාජ හා මානසික කැළඹීම් තත්වයකට ළමයා පත්වීම
- VI. ළමයා විසින් සංකල්ප ගොඩනැගීමේ දී අහිතකර ආකාරයෙන් බලපෑම් ඇති වීම

තව ද ශාරීරික දඬුවම් දීමෙන් තොරව විනය පවත්වාගෙන යා නොහැකි නම් එමගින් පිළිබිඹු කරන්නේ ගුරුවරයාගේ අදක්ෂ භාවය බව පැහැදිලි වේ.

2.2 ශාරීරික දඬුවම් වෙනුවට පහත සඳහන් විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි ය.

- I. පාසලේ සිටින සිසුන් විනය විරෝධී ක්‍රියාවන්හි යෙදීමට ඇති ඉඩකඩ අවම කිරීම පිණිස පාසලේ ක්‍රියාකාරිත්වය හා විෂය සමගාමී කටයුතු මනාව සංවිධානය කර තිබීම.
- II. පාසලේ විනය නීති පද්ධතිය පිළිබඳව සියලු දෙනාව ම දැනුවත් කිරීම හා යහපත් ක්‍රියා ප්‍රතිපෝෂණය කිරීම කළ යුතු අතර වැරදි ක්‍රියාවලට අනුබල නොදීම හෝ අනුමත නොකිරීම.
- III. මනා හැසිරීම් රටාවක් ඇති කිරීමටත් පාසල තුළ විනය පවත්වා ගෙන යාමටත් විනයානුකූල හැසිරීමේ වැදගත්කම අවබෝධකරදීම, ආදර්ශමත්වීම හා සිසුන්ට නිසි මාර්ගෝපදේශනය ලබාදීම.
- IV. ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් වරදක් කළ අවස්ථාවක දී ඔහු/ ඇය විසින් කරන ලද වරද අවබෝධ කරදීම.
- V. තදබල විනය විරෝධී කටයුතු සිදුකළ අවස්ථාවන්හි දී ද, ශාරීරික දඬුවම් දීම වෙනුවට අවවාද කිරීම හා/හෝ දෙමාපියන්ට/ භාරකරුවන්ට දැනුම්දීම.
- VI. වරද කළ ශිෂ්‍යයා/ ශිෂ්‍යයාව භුක්ති විඳින වරප්‍රසාද සීමා කිරීම හෝ අත්හිටුවම. උදාහරණයක් ලෙස පංති නායක, ශිෂ්‍ය නායකභාවය අහෝසි කිරීම් වැනි ක්‍රියාමාර්ගයක් ගත හැකි ය.
- VII. බරපතල විනය විරෝධී ක්‍රියාවක් සිදුකළවිට දෙමාපියන්ට දන්වා සති 02කට නොවැඩිකාලයක් පංති තහනම් කිරීම.